**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) අදියර -II 2017.**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) අදියර II හි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය අතර 2001 පෙබරවාරි 20 දින එළඹි ගිවිසුම යටතේ පිටත වටරවුම් මහාමාර්ගයේ සිට කොළඹ නගරයට විස්තරාත්මක සැලසුම් අධ්‍යයනයක් සඳහා ලද රු. මිලියන 417 කට සමාන ජපන් යෙන් මිලියන 580 ක ප්‍රදානයකින් මෙම ව්‍යාපෘතිය ඇරඹිණි. තවද මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අදියර II යටතේ කඩුවෙල සිට කඩවත දක්වා මහාමාර්ග කිලෝමීටර් 8.9 ක් ඉදිකිරීමට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිත ආයතනය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමඟ එස්එල්-පී 91 හා එස්එල්-පී 101 දරණ ණය ගිවිසුම් වලට පිළිවෙලින් 2008 ජූලි 29 දින සහ 2011 මාර්තු 22 දින එළඹි තිබුණි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අදියර II හි ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ නාගරික ප්‍රදේශයේ වාහන තදබදය අවම කිරීමට හැකි වන පරිදි දක්ෂිණ අධිවේගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මාර්ග සමග සම්බන්ධ වන කොළඹට මායිම්ව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම හා එමගින් රටේ අනෙකුත් ප්‍රදේශ සමග සම්බන්ධතාවය පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය ගිවිසුම අනුව, අදියර II ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 55,482 කට සමාන ජපාන යෙන් මිලියන 44,097 ක් වූ අතර ඉන් රු.මිලියන 46,759 කට සමාන ජපාන යෙන් මිලියන 37,406 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. අදියර II යටතේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2009 ඔක්තෝබර් 22 දින ආරම්භ කර තිබුණු අතර අදාල ඉදිකිරීම් වැඩ 2015 ජූලි 18 දින නිම කර තිබුණි.කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය

ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ,ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති

අධිවේගී මාර්ගය ඉදිකිරීමේ පිරිවැය අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. එසේ වුවද කඩුවෙල සිට කඩවත දක්වා අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2015 ජූලි 18 දින අවසන් තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුව රු. මිලියන 24.20 ක උපදේශන සේවා ගාස්තු මූල්‍ය ප්‍රකාශන තුළට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් නිශ්චිත සංඛ්‍යාමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන් කිරීම | අරමුදල් උපයෝජනය<br>2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ යි කා | | | | | | | |
| ණය අංක එස්එල්-පී91 | 5,718 | 5,445 | | | | | |
| ණය අංක එස්එල්-පී101 | 31,688 | 41,314 | 350 | 278.59 | 370.69 | 34,814.48 | 46,324.15 |
| ශ්‍රී.ලං.ර | 6,691 | 8,723 | 100 | 64,63 | 86.00 | 1,089.00 | 1,449.03 |
| එකතුව | 44,097 | 55,482 | 450.00 | 343.22 | 456.69 | 35,903.48 | 47,773.18 |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------------

රු. බිලියන 44.88 ක පිරිවැයකට ඇස්තමේන්තු කළ කඩුවෙල සිට කඩවත දක්වා වූ කි.මී. 8.9ක දිගින් යුතු පිටත වට රවුම් මාර්ගයේ කොන්ත්‍රාත් වැඩ 2015 ජූලි 18 දින අවසන් කර තිබුණි.2017 දෙසැම්බර් 31 දිනට සහතික කරන ලද වැඩ අනුව සම්පූර්ණ කොන්ත්‍රාත් පිරිවැය රු. බිලියන 47.82 කි.පසුව අනුමත කරන ලද දින 190 ක කාලය මත පදනම්ව කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීමේ පිරිවැයක් ලෙස ඉදිරිපත් කරන ලද රු. බිලියන 4.37 ක අයිතිවාසිකමක් 2017 දෙසැම්බර් 31 දින වන විට නොපියවා තිබීම සහ ආරාවුල් විනිශ්චය මණ්ඩලය වෙත යොමු කර තිබුණි.

## 3.3 මූල්‍ය පරිපාලනයේ ගැටළු

---------------------------------

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට විය පැහැදම් නොකළ ශේෂය මත ණය දෙන ආයතනය විසින් රු. මිලියන 66.41 ක් බැඳීම් ගාස්තු ලෙස අය කරගෙන තිබුණි.

## 3.4 ඉඩම් අත්පත්කර ගැනීමේ හා කටයුතු ප්‍රතිස්ථාපන කටයුතු

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගැනීම සඳහා වැඩසටහනට ඇතුලත් කරන ලද ඉඩම් කැබලි 1323 න් ඉඩම් කැබලි 1205 ක් පමණක් අත්පත් කර ගෙන තිබීම සහ ඒ සඳහා 2017 දෙසැම්බර් වන විට රු.මිලියන 1786 ක් වන්දි ලෙස ගෙවා තිබුණි.කෙසේ වෙතත් ඉඩම් කැබලි 614 ක් පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ එම දිනය වන විට ලියාපදිංචි කර තිබුණි.තවද ව්‍යාපෘතිය විසින් රජයේ ඉඩම් ඇතුළුව අත්පත් කර ගත් ඉඩම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් වාර්තාවක් නඩත්තු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් රු.මිලියන 22.8 ක වියදමක් දරමින් අත්පත් කර ගත් කැබලි 28 කින් යුත් බියගම රුක්අත්තනගහවත්තේ අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.ඍතුමය ගංවතුර වැළැක්වීමට ඉදි කරන ලද ආරක්ෂක තාප්පයක් (Gabion wall) නිසා මුළු ප්‍රමාණයෙන් ඉඩම් කැබලි 7 ක් බෙදීමට ලක්වීම නිසා නැවත පදිංචි කිරීමේ අරමුණ සඳහා යෝග්‍ය නොවුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල් පියවීම ප්‍රමාද වීම නිසා පොලී ලෙස රු. මිලියන 301.6 ක් වියදම් කර තිබුණි.තවද ඉඩම් අත්පත් කර ගැනීමේ නිළධාරීන්ට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වේගවත් කිරීම සඳහා දිරි දීමනා ගෙවා තිබුණි.

## 3.5 ව්‍යාපෘතියේ කටයුතු නිම වීම

-----------------------------------

ව්‍යාපෘති කටයුතු සහ ණය දෙන කාල සීමාව 2015 ජූලි 18 දිනට අවසන් වී තිබුණ ද හිඟ ශේෂ පියවීමට,ව්‍යාපෘතියේ අවසාන ගිණුම් පිළියෙල කිරීමට සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් අධීක්ෂණ ඒකකයේ කටයුතු වසා දැමීමට හැකි වන ලෙස ක්‍රියාත්මක කරන ආයතනය වෙත වගකීම් පැවරීමට අවශ්‍ය උපදෙස් ක්‍රියාත්මක කරවන ආයතනය විසින් නිකුත් කර නොතිබුණි.